# දවුල්දෙණ ඤාණිස්සර හිමියන් විසින් රචිත 'යතිදූතම්' කාව්‍යය පිළිබඳ විමර්ශනයක්

**වැලිපිටියේ ඉන්දානන්ද හිමි**

ශ්‍රී ලාංකේය නූතන සංස්කෘත සාහිත්‍යය පෝෂණය කිරීමට කැපවන, ඒ වෙනුවෙන් ශාස්ත්‍රීය දායකත්වය ලබා දෙන යතිවරුන් අතර දවුල්දෙණ ඤාණිස්සර නාහිමියන් මුල් පෙළෙහි ලා සැලකිය හැකි සකු පඬිවරයෙකි. සංස්කෘත භාෂා සාහිත්‍යයේ ජාත භූමිය භාරත දේශය වුවත් එය මෙරට සිංහල භාෂා සාහිත්‍යයික ක්‍රියාදාමයේ ප්‍රධාන භූමිකාවක් නිරූපණය කළ බව ඉතා පැහැදිලි කරුණකි. ඒ අනුව පද්‍යකරණයට උපදෙස් දීමේ අදහසින් අනුරාධපුර යුගයේ රචිත සියබස්ලකර නම් කෘතියේ පටන් මෙරට සාහිත්‍යයට සංස්කෘතයේ ආලෝකය අඩුවැඩි වශයෙන් ලද අතර සංස්කෘත පිළිබඳ අධ්‍යයනයෙන් දැනුම මුවහත් කර ගත් ඇතැම්හු සංස්කෘත මාධ්‍යයෙන්ම ග්‍රන්ථ රචනා කිරීමට නැඹුරු වූහ. දවුල්දෙණ ඤාණිස්සර නාහිමියන්ද එම වංශාවලියේ වර්තමාන පුරුකක් වශයෙන් සැලකිය හැකිය. උන්වහන්සේ මේ වන විට සංස්කෘත මාධ්‍යයෙන් ග්‍රන්ථ ගණනාවක් රචනා කර ඇති අතර ඒ සියල්ලම කාව්‍ය සංග්‍රහ වීමද විශේෂත්වයකි.[1] මේ අතරින් යතිදූතම් ග්‍රන්ථය සඳහා සංස්කෘත



චක්‍රවර්තී උපාධියද ධර්මචින්තා කාව්‍ය ග්‍රන්ථය සඳහා ජනාධිපති සම්මානයද වෛරාග්‍යචින්තා ග්‍රන්ථය සඳහා ග්‍රන්ථවිශාරද උපාධියද හිමි වී ඇත. මීට අමතරව ප්‍රශස්ති, ගුණානුස්මරණ හා ශුභාශිංසන වශයෙන් උන්වහන්සේ පද්‍යාවලීන් සිය ගණනක් රචනා කර ඇත.[2]

## යතිදූතම් සන්දේශ කාව්‍යය

දවුල්දෙණ ඤාණිස්සර නාහිමියන් විසින් රචිත සමස්ත නිර්මාණාවලිය අතුරින් මෙහිදී අවධානය යොමු කරනු ලබන්නේ යතිදූතම් කාව්‍ය සංග්‍රහය පිළිබඳවයි. ඔලිවර් ගුරුසිංහ නම් මහතෙකු විසින් 1987 වර්ෂයේදී රාජගිරිය, නාවල, සරස්වතී මුද්‍රණාලයේ මුද්‍රණය කර පළ කරන ලද යතිදූතම් සංස්කෘත සන්දේශ කාව්‍යය වෙනුවෙන් දවුලදෙණ නාහිමියන්ට සංස්කෘත චක්‍රවර්තී උපාධියද හිමි වී ඇත. එයද මෙම කෘතියේ ඇති වටිනාකම පිළිබඳ යම් අවබෝධයක් ලබා ගැනීමට මග පාදයි. "සන්දේශ ප්‍රේෂක, භාරක සහ ග්‍රාහක යන තිදෙනාම යතිවරුන් නිසා යතිදූතම් යනුවෙන් නම් කරන ලදි." යනුවෙන් ග්‍රන්ථ නාමකරණය පිළිබඳ විග්‍රහයක් යතිදූතම් කාව්‍යය හැඳින්වීමේදී සඳහන් වේ. ඒ අනුව ලක්දිව සන්දේශ සාහිත්‍යයේ පමණක් නොව සංස්කෘත සන්දේශ සාහිත්‍යයෙහිද වැදගත් ලක්ෂණයක් වශයෙන් එය මතු කර ගත හැකිය. එක් අතකින් මෙය සාම්ප්‍රදායික සන්දේශ කාව්‍යකරණය නැවුම් මාවතකට යොමු කිරීමකි. ලාංකේය සන්දේශ සාහිත්‍යය තුළ භික්ෂුව මූලික චරිතයක් වූයේය.

කෝට්ටේ යුගයේ රචිත සිංහල සන්දේශවලින් බහුතරයක් රචනා වූයේ බෞද්ධ භික්ෂූන් වහන්සේ අතිනි. ඒ අතරින් ඇතැම් සන්දේශවල ග්‍රාහකයා වූයේද ලක්දිව ප්‍රකට යතිවරයෙකි. එහෙත් මෙපරිද්දෙන් ප්‍රේෂක, හාරක හා ග්‍රාහක යන චරිතත්‍රයම භික්ෂූන් වහන්සේ වෙත ගොනු වීම නවතාවකි. එමගින් සන්දේශ සාහිත්‍යයේ නව ප්‍රවණතාවක් ඇති වූවා යැයි සැලකියි හැකි අතර ලක්දිව සන්දේශ කාව්‍යකරණය තවදුරටත් බෞද්ධාගමික මුහුණුවරකට නතු වූ බවක්ද සිතිය හැකිය. අනෙක් අතට යතිදූතම් කාව්‍යය රචනා කිරීම දවුල්දෙණ නාහිමියන් මුහුණදුන් ප්‍රබල ශාස්ත්‍රීය අභියෝගයක් වූවාට සැක නැත. ඊට හේතුව සන්දේශයේ ප්‍රධාන චරිත ත්‍රයම භික්ෂුව වටා ගොනු වීමත් සමග ඊට අනුරූප වන පරිදි සාම්ප්‍රදායික සන්දේශ රචනා රටාවේ බොහෝ වෙනස්කම් කිරීමට සිදු වේ. උදාහරණයක් වශයෙන් අනෙකුත් සිංහල සන්දේශවලදී ස්ත්‍රී චරිත වර්ණනා කරන ආකාරය හාත්පසින්ම වෙනස් කිරීමට සිදු වේ. භික්ෂුවක් ඒ දෙස බලන ආකාරය ආගමික අරමුණුවලින් ඉවත් කිරීමට නොහැකි වීම ඊට හේතුවයි. (මේ පිළිබඳ ඉදිරියට තවදුරටත් සාකච්ඡා කෙරේ.) ශ්‍රී ලංකාවේ පැවති ත්‍රස්තවාදී උපද්‍රවය කරණකොටගෙන ලෝකපාලක දේවගණයාගේ ප්‍රකෝපය මගහරවා රටත් මහජනයාත් ලක් බුදුසසුනත් ආරක්‍ෂා කරනු වස් සත්දින පිරිත් දෙසුමක් පවත්වා දෙවිවරුන් වෙත සංඝාඥාවක් කරන ලෙසට එවකට කොළඹ විද්‍යෝදය පරිවේණාධිපති ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය මහෝපාධ්‍යාය ශාස්ත්‍රපති රාජකීය පණ්ඩිත ගෞරවාර්හ අකුරැටියේ අමරවංශ නාහිමියන්ගෙන් ආයාචනා කිරීම මෙහි ප්‍රස්තුතයයි.[3]



"ශ්‍රී ඝනාය නමඃ" යනුවෙන් බුද්ධාභිවන්දනාවකින් ආරම්භ වන යතිදූතම් කාව්‍යය ඡන්දස් කිහිපයක් පමණක් උපයෝගි කර ගෙන පබඳින ලද ශ්ලෝක දෙසීයතිස් අටකින් පරිමිත වේ. එම පද්‍ය සංඛ්‍යාවට අමතරව කර්තෘ නාම සංදර්ශනය සඳහන් පද්‍යයක්ද උපකාරානුස්මෘතිය වෙනුවෙන් පද්‍ය දෙකක්ද 'සන්දේශසමර්පණම්' යන තේමාව යටතේ අකුරැටියේ අමරවංශ නාහිමියන් වෙත සන්දේශය පිළිගැන්වීම වෙනුවෙන් තවත් පද්‍ය හතරක්ද රචනා කර ඇත. ඒ අනුව ග්‍රන්ථාවසානයේ සඳහන් වන එම ශ්ලෝක හතද ඇතුළුව ගතහොත් මෙම කෘතිය පද්‍ය දෙසීයහතළිස් පහකින් සමන්විත වේ.

සන්දේශ හාරක භික්ෂුවගේ ගමනාරම්භය සිදු වන්නේ උව පළාතේ සපුගොල්ල නම් ප්‍රදේශයේ පිහිටි උඩරට අමරපුර නිකායේ මූලස්ථානය වශයෙන් සැලකෙන තපෝධනාරාමයෙනි. ඉන් අනතුරුව අනුක්‍රමයෙන් වැලිමඩ, දියුරුම්වෙල, කැප්පෙටිපොල, විදුරපොල, හක්ගල, සීතාඑළිය, නුවරඑළිය, පිදුරුතලාගල, ශ්‍රීපාදස්ථානය, රම්බොඩ, පුස්සැල්ලාව, ගම්පොළ, මහනුවර, දළදා මැඳුර, පේරාදෙණිය, පේරාදෙණි සරසවිය, කඩුගන්නාව, මාවනැල්ල, කෑගල්ල, බටලීය, නිට්ටඹුව, හොරගොල්ල වලව්ව, බණ්ඩාරනායක සමාධිය, ගම්පහ සිද්ධායුර්වේද විද්‍යාලය, කැලණිය යන ස්ථානද වර්ණනා කරමින් කැලණිය විද්‍යාලංකාර පිරිවෙණෙන් ගමනාන්තය සටහන් කරයි. මෙහි සන්දේශ ප්‍රේෂක, දවුල්දෙණ ඤාණිස්සර නාහිමියන් වර්තමානයේ ශ්‍රී ලංකා අමරපුර නිකායේ උත්තරීතර මහානායක ධුරය උසුලන

අතර කෘතිය රචනා කළ කාලය වන විට උඩරට අමරපුර නිකායේ මහානායක ධුරය හෙබවූහ. සන්දේශ ග්‍රාහක, අකුරැටියේ අමරවංශ නාහිමියන් සියම් නිකායේ මල්වතු පාර්ශ්වයට අයත් ප්‍රධාන පෙළේ විහාරස්ථානයක සහ විද්‍යාස්ථානයක ප්‍රධානියායි. ඒ අනුව මෑත කාලීන ලංකාවේ නිකායාන්තරික සංඝ සාමග්‍රිය පෙන්නුම් කරන වැදගත් සාක්ෂ්‍යයක් වශයෙන්ද මෙම රචනාව විග්‍රහ කළ හැකිය.

### දූත වර්ණනාව

යතිදූතම් කාව්‍යයේ මුල් පද්‍ය ත්‍රය වෙන් වන්නේ දූතයා වර්ණනා කිරීමටයි. එය සාමාන්‍යයෙන් සිංහල සංදේශ කාව්‍යවලද ක්‍රමවේදයයි. එහෙත් මේඝදූතයේදී කාලිදාස භාවිත කර ඇත්තේ මේ මග නොවේ. එහිදී ප්‍රථම පද්‍යය වෙන් වන්නේ වස්තු නිර්දේශය දැක්වීම සඳහායි. ඒ අනුව මෙහිදී යතිදූතම් කතුවරයා වඩාත් රුචි කර ඇත්තේ සිංහල සන්දේශ කාව්‍යවල ආකෘතියට අනුගත වීමටයි. එසේ වුවත් රචකයාට වඩාත් ස්වාධීන මාර්ගයක් අනුගමනය කිරීමට සිදු වන්නේ මෙවැනි අද්දැකීමක් එනම්, භික්ෂුවක් සන්දේශ හාරකයා වශයෙන් තබාගත් අවස්ථාවක් වෙනත් කිසිදු සිංහල හෝ සංස්කෘත සන්දේශයක නොමැති වීමයි. මේඝදූතයේදී සන්දේශ හාරකයා වශයෙන් තබාගත් මේඝය වර්ණනා කරන කාලිදාස පවසන්නේ 'පුෂ්කර හා ආවර්තක වශයෙන් උපන් ඔබ ඉන්ද්‍ර දෙවියාගේ ස්වරූපයන් ගැනීමට සමත් ඇත්තෙකි.'[4] යනුවෙනි. එහෙත් ඥාණිස්සර හිමියන්ගේ දූතකාව්‍යයේ දූතයා වන භික්ෂූන් වහන්සේ බුදුරදුන්ගේ තුන් පිටකය දන්නා



වූ, නිවනෙහි ඇළුණු සිත් ඇති, ප්‍රතිපත්තිකාමී, මෛත්‍රී - කරුණා ගුණරත්නයන්ට නිධාන වූ, කීකරු වූ, සත්සුන් ඉඳුරන් ඇති, ඥාන තේජසින් නසන ලද පාප නමැති අන්ධකාර ජාලය ඇති, ප්‍රීතියට හේතු වූ ජනයා විසින් බොහෝ සෙයින් වඳිනු ලබන අර්ථ සිද්ධිය සඳහා හේතු වන මිතුරෙකු වන උත්තම ගණයේ චරිතයකි. මීට අමතරව දූත කාර්යය සඳහා එවැනි චරිතයක් තෝරා ගැනීමේදී කතුවරයා නොහොත් සන්දේශ ප්‍රේෂකයා අවධානය යොමු කළ තවත් උදාර ගුණාංග කිහිපයක් වේ.

1. බුදුරදුන් කෙරෙහි භක්තිය (ත්‍රෛලොකනායකෙ භක්තිඃ)
2. ගුරුවරයා කෙරෙහි අවනතිය (ගුරෞ අවනතිඃ)
3. ස්වකීය ආත්ම දමනයෙහි ශක්තිය (නිජාත්මදමනෙ ශක්තිඃ)
4. පරාර්ථයෙහි ඇලීම (පරාර්ථෙ අභිරතිඃ)
5. යහපත් කටයුතු කිරීමේ ආශාව (සුකාර්යකරණෙ ඉච්ඡා) යනුවෙනි.[5]

දුවුල්දෙණ ඥාණිස්සර හිමියන්ගේ දූතකාව්‍යය බොහෝ සිංහල සන්දේශ කාව්‍යවලදී මෙන් පොදු අරමුණක් සහිත වූවකි. කාලිදාසගේ මේඝදූතයේදී මෙන් පෞද්ගලික අපේක්ෂාවක් එහි නොමැත. එවැනි පොදු අරමුණක් උදෙසා මෙහෙයවන අයෙකු තුළ (දූතයා තුළ) ඉහත ගුණාංග පැවැතීම අත්‍යවශ්‍ය වේ. අනෙක් අතට, භික්ෂූන් වහන්සේ

නමක් වන දූතයා වර්ණනා කිරීමට හැකි වන්නේ ආධ්‍යාත්මික ගුණ සමූහය කේන්ද්‍ර කර ගෙන මිස බාහිර අලංකරණය හෝ එවැනි වෙනත් යමක් ඇසුරු කර ගෙන නොවේ. සන්දේශ හාරක භික්ෂුවගේ ගරුත්වයද ආරක්ෂා කරමින් තමන් වහන්සේගේද අරමුණ ඉෂ්ට කර ගන්නා අතර පාඨකයා තුළ කිසිදු අනවබෝධයක් හෝ අවිශ්වාසයක් ඇති නොවන පරිදි සියල්ල නිරවුල්ව මෙහෙයවීමට කර්තෘවරයා දක්ෂ වී ඇති බව මෙයින් පැහැදිලි වේ.

### ග්‍රාමනාම නිරූපණයේ විශේෂ ලක්ෂණ

යතිදූතම් සන්දේශ කාව්‍යය කියවීමේදී දක්නට ලැබෙන තවත් විශේෂ ලක්ෂණයක් වශයෙන් එහි එන ග්‍රාම නාම නිරූපණය සඳහන් කළ හැකිය. එය මෙම කෘතියට කිසියම් නවතාවක් එක් කර ඇතැයි කීමේ වරදක් නැත. එහිදී,

1. පවතින ක්‍රමයට අනුව දැනට භාවිත කරන ග්‍රාම නාමය ඒ ආකාරයෙන්ම භාවිත කිරීම
2. පවතින සිංහල ග්‍රාම නාමය ඇතැම් අවස්ථාවක සෘජුවම සංස්කෘතයට නැගීම

යන ක්‍රමවේද දෙකම විටින් විට භාවිත කර ඇත. ඒ පිළිබඳ සම්පූර්ණ විස්තරයක් පහත සඳහන් වේ.



| පවතින ක්‍රමයට අනුව දැනට භාවිත කරන ග්‍රාම නාමය ඒ ආකාරයෙන්ම භාවිත කර ඇති අවස්ථා | පවතින සිංහල ග්‍රාම නාමය ඇතැම් අවස්ථාවක සෘජුවම සංස්කෘතයට නැගීම |
|---|---|
| දවුල්දෙන (17)[6]<br>කරගහල්පත (18)<br>දිවුරුම්වල (30)<br>කැප්පටිපල (32)<br>විදුරුපල (36)<br>උඩුහාවර (77)<br>රම්බඩ (96)<br>පුස්සල්ලාව (97)<br>ගම්පල (118)<br>පේරාදෙණිය (119, 140)<br>පලිපහණ (133)<br>හල්යාල (134)<br>කඩුගන්නාව (143)<br>මාවනැල්ල (146)<br>කෑගල්ල (151)<br>බටලීය (154)<br>නිට්ටඹුව (156)<br>හික්කඩුව (210)<br>අකුරැටිය (223) | චම්පෙය්‍යගුල්මං (07) > සපුගොල්ල<br>වාලුකාමණ්ඩ (27) > වැලිමඩ<br>ශඞ්ඛශෛල (40) > හක්ගල<br>සීතාලෝක (51) > සීතාඑළිය<br>සීතාදෙව්‍යායතනං (52) > සීතාකෝවිල<br>නගරාඞ්ගණ (68) > නුවරඑළිය<br>පලාලතල (72) > පිදුරුතලාගල<br>වජ්‍රෝපල (79) > විදුරපොල<br>පෘථුවාලුකානදී () > මහවැලි ගඟ<br>ගඞ්ගාශ්‍රීනාමනගර (101) > ගඟසිරිපුර<br>ගඞ්ගොපල (103) > ගම්පොළ<br>ක්ෂේමකාණ්ඩගිරි (123) > සෙත්කඩගල<br>ශ්‍රීමාලවාස්ත (132) > සිරිමල්වත්ත |

| | |
|---|---|
| | කජ්ජුග්‍රාම (154) > කජුගම<br>සරලාවටී (163) > හොරගොල්ල<br>ග්‍රාමපඤ්ච (179) > ගම්පහ<br>යක්‍ෂශාලා (179) > යක්කල<br>යක්‍ෂබඩ්ග (189) > යක්කඩුව |

එක් අතකින් විමසා බැලූ විට මෙය සිත් ගන්නා සුලු ස්වභාවයකි. විශේෂයෙන්ම සිංහල ග්‍රාමනාම පවතින ස්වරූපයෙන්ම සංස්කෘතයට පරිවර්තනය කිරීමෙහිලා ඤාණිස්සර හිමියන් විශේෂ කැමැත්තක් දක්වා ඇති වග පෙනේ. වරෙක මෙය කර්තෘවරයාගේ ප්‍රයෝගයක් වශයෙන් සිතිය හැක්කේ එමගින් එකහෙළාම සිංහල ග්‍රාමනාම සංස්කෘත ග්‍රන්ථයකදී භාවිත කිරීමෙන් ඇති විය හැකි නොගැළපෙන බව විතැන් කිරීමත් තවත් විටෙක ඡන්දස් ආරක්‍ෂා කිරීමෙහිලා සාර්ථක ප්‍රයෝගයක් වීමත් හේතුවෙනි. මෙය ඡන්දස ආරක්‍ෂා කිරීමෙහිද ප්‍රයෝගයක් වශයෙන් සැලකිය හැකි වන්නේ එකසිය දහ අට වැනි ශ්ලෝකයේදී 'ගම්පල' යනුවෙන් සඳහන් කළද එකසිය තුන් වැනි ශ්ලෝකයේදී එයම 'ගඩිගොපල' යනුවෙන් සංස්කෘතකරණය කර තිබීමයි. එහිදී එක හෙළාම උත්සාහ කර ඇත්තේ ඡන්දසෙහි විධිමත් බව ආරක්‍ෂා කර ගැනීමටය. එහෙත් එසේ සිංහල ග්‍රාම නාම සංස්කෘතයට පෙරළීමේදී හැකිතාක් සරල ක්‍රමවේදයක් භාවිත කර තිබීමද වැදගත් ලක්‍ෂණයකි. තවත් පැහැදිලි කරන්නේ නම් බොහොමයක් ග්‍රාමනාම



සංස්කෘතයට පෙරළා ඇත්තේ සිංහල ඡායාව රැකෙන පරිදිය. නැතහොත් සිංහල වචන සෘජුවම සංස්කෘතයට පෙරළීමෙනි. එසේම 'දිවුරුම්වල' පිළිබඳ සිදු කරන විස්තරය වැදගත් වන්නේ එහි ග්‍රාම නාමකරණය උදෙසා බලපෑ සීතාට සම්බන්ධ පුරා වෘත්තයද සඳහන් කර තිබෙන හෙයිනි.

ග්‍රාමනාම භාවිතයේ දක්නට ලැබෙන මෙකී සුවිශේෂිතාවට අමතරව පාලි, ඉංග්‍රීසි හා සිංහල වචන භාවිතයේ සුවිශේෂිතාව ඉස්මතු වන තවත් මෙවැනි අවස්ථා කිහිපයක් යතිදූතම් කාව්‍යයෙන් උපුටා ගත හැකිය.

උදා ඃ-

| | | |
|---|---|---|
| කෘත්‍ය මෛත්‍රී සූත්‍රං (12) | - | කරණීයමෙත්ත සූත්‍රය |
| ජගුවර් යානං (21) | - | ජගුවර් රථය |
| ජලවර්ධන (200) | - | දියවඩන (නිලමේ) |

## විශේෂ භාෂා ලක්‍ෂණ

ඉහත සඳහන් කළ ග්‍රාම නාම නිරූපණයට අමතරව යතිදූතම් කර්තෘවරයා භාවිත කර ඇති විශේෂ භාෂා ලක්‍ෂණ පිළිබඳවද අවධානය යොමු කළ යුතුය. එහිදී පැහැදිලිව පෙනෙන එක් ලක්‍ෂණයක් වන්නේ එක් එකම වචනය එකවර එකම විභක්තියකින් යෙදීමට කර්තෘවරයා වැඩි කැමැත්තක් දක්වා ඇති බවයි. මෙය කාලිදාසයන්ගේ මේඝදූතයේද දක්නට ලැබෙන ලක්‍ෂණයකි.

මේඝදූත

මන්දං මන්දං නුදති පවනශ්චානුකූලො යථා ත්වාං

(10 පද්‍යයේ 1 පාදය)

කාලෙ කාලෙ භවති භවතො යස්‍ය සංයොගමෙත්‍ය

(12. 03)

යතිදූතම්

සික්ත්වා සික්ත්වා ශිශිරසලිලං සද්‍රසං සම්ප්‍රයුජ්‍ය

(39 පද්‍යයේ 2 පාදය)

ගුඤ්ජං ගුඤ්ජං භ්‍රමරනටකෛර්ලීඪකිඤ්ජල්කභාරඃ

(44.02)

## රාවණ රාජ වර්ණනාව

යතිදූතම් කාව්‍යයේ දක්නට ලැබෙන තවත් සුවිශේෂී අවස්ථාවක් වශයෙන් රාවණ රාජ වර්ණනාව හැඳින්විය හැකිය. රාවණ යනු ස්ත්‍රී ලෝලී, අසාධාරණ, නොමනා, පරාජිත රජෙකු යැයි රාම පුදනු ලබන ඉන්දියානු උගතුන් විසින් අතීතයේ සිටම විග්‍රහ කර ඇත. ඒ සෑම අවස්ථාවකම රාම සාධාරණත්වය, රණශූරත්වය වැනි උතුම් චරිතාංගවල ප්‍රතිමූර්තිය වන අතර රාවණ එහි විරුද්ධ ලක්ෂණ ඇත්තාය. මෙම අදහස මෙරට සිටි ඇතැම් උගතුන් විසින්ද අනුමත කළා යැයි සිතිය හැකි ආකාරයේ අදහසක් සිදත් සඟරාවේද සඳහන් වෙයි.[7] එහෙත් දවුල්දෙණ නාහිමියන් විසින් රාවණ රජු පිළිබඳ කරනු ලබන විග්‍රහය මගින් ඉන්දියානු උගතුන්ගේ



හා නිර්මාණකරුවන්ගේ ඒකපාර්ශ්වීය රාමවර්ණනාවට සියුම් පහරක් එල්ල කරන ආකාරයක් පෙනේ. මෙරට වෙනත් කිසිදු සම්භාව්‍ය ග්‍රන්ථයකදී දැකගත හැකි නොවන ආකාරයට උන්වහන්සේ රාවණ රාජ චරිතය වර්ණනා කරති. 'රාවණ රාජ සංකල්පය' මේ වන විටත් විවාදාපන්න වූවක් වුවත් එය ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ප්‍රෞඪත්වය, මානවීය ගුණාංග, රණශූරත්වය, ශික්ෂණය විදහාපාන කදිම අවස්ථාවක් වශයෙන් විග්‍රහ කිරීමට ඇතැම් උගත්තු පෙලඹෙති. ඒ අනුව යතිදූතම් කාව්‍යයේ සඳහන් රාවණ රාජ වර්ණනාව මගින් දවුල්දෙණ ඤාණිස්සර නාහිමියන්ගේ දේශප්‍රේමී සිතිවිලි නිරායාසයෙන්ම ඉස්මතු වන ආකාරයක් පෙනේ. රාවණ රාජ වර්ණනාවේ එක් අවස්ථාවකදී උන්වහන්සේ සඳහන් කරන්නේ රාවණ රජු භාරතයේ දසරජවරුන්ගේ හිස් තමන්ගේ පා දූහුවිල්ලෙන් සැරසූ බවයි (62 පද්‍යය). එය බොහෝ විට භාරතයේ පැරණි රජවරුන් වර්ණනා කිරීමේදී භාවිත කළ අදහසකි. එසේම රාම රජුට ගෞරවයක් ඇති වන සේ ඉන්දීය උගතුන් විසින් විස්තර කරනු ලබන සූර්පණකා නමැති රාවණගේ සහෝදරිය පිළිබඳ කථාව ඉතා සැකෙවින් නමුත් අරුත් පැහැදිලි වන පරිදි සඳහන් කර ඇත. එම කථාවට අනුව ප්‍රදේශ පාලනයෙහි නියුක්තව සිටි සූර්පණඛා නමැති රාවණගේ සහෝදරියට දශරථපුත්‍ර රාම හිංසා කරයි. එය ඇසූ රාවණ, රාම පිළිබඳ කිපී ස්වකීය සහෝදරියට කළ හිංසාවට පලිගැනීමක් වශයෙන් රාමගේ භාර්යාව වන සීතා ලක්දිවට රැගෙන එයි. එය දූරාචාරයක් කිරීමේ අදහසකින් සිදුකළ කටයුත්තක් නොවන බව කතුවරයා අවධාරණය කරයි

(66 පද්‍යය). භාරතයේ රචිත බොහෝ සංස්කෘත ගද්‍ය පද්‍ය රචනාවලදී නිරන්තරයෙන් වර්ණනා කෙරෙන රජවරුන්ගේ ස්වභාවය මෙහිදීද අත්විඳිය හැකිය. එහෙත් සැම භාරතීය උගතකු විසින්ම අතිශයෝක්තියෙන් වර්ණිත රාම චරිතය ඤාණිස්සර නාහිමියන් අතින් කිසියම් විවේචනයකට ලක් වී ඇති අතර භාරතීය උගතුන් විසින් රාමට ලබා දෙන අත්‍යුත්කෘෂ්ට ස්ථානය රාවණ වෙත මෙහිදී ආරෝපණය කරයි. කථාවේ සංසිද්ධි කථනය එසේ වෙනස් කර තිබුණත් තමන්ට කියවා ඉතා හුරු පුරුදු භාරතීය සංස්කෘත ගද්‍ය - පද්‍ය නිර්මාණවල ආභාසය මගහැර යන්නට කතුවරයාට නොහැකි වී ඇති බවක් පෙනේ.

## ත්‍රිවිධ චෛත්‍ය වන්දනාව

යතිදූතම් කාව්‍යයේ දූතයා ගමන් අරඹන්නේ ඌව දිශාවේ උඩුකිඳ, ඌව පරණගම, සපුගොල්ලේ තපෝධනාරාම විහාරයෙනි. ගමනාරම්භයට පූර්වයෙන් දූතයා ත්‍රිවිධ චෛත්‍ය වන්දනා කරයි. සිද්ධස්ථාන වන්දනා කිරීමේදී ශාරීරික, පාරිභෝගික, උද්දේසික යන පිළිවෙළට අනුව පළමුව චෛත්‍යයත් දෙවනුව බෝධියත් තෙවනුව බුද්ධ ප්‍රතිමාවත් වන්දනා කිරීම බෞද්ධ සම්ප්‍රදායයි. එහෙත් මෙහිදී දූතයා පළමුව වඳින්නේ බුද්ධ ප්‍රතිමාවයි (09 පද්‍යය); දෙවැනිව බෝධියයි (10); තෙවැනිව චෛත්‍යයයි (11). කුමන අරමුණක් ඇතිව මෙවැන්නක් සිදු කළේදැයි තේරුම් ගැනීම උගහටය. එහෙත් සිය ගමන අතරතුරදී දූතයාට හමුවන, ගිමන් හරින, වැඩ සිටින අනෙකුත් ස්ථාන වන්දනා කරන ලෙස උවදෙස් දෙන්නේ ශාරීරික, පාරිභෝගික, උද්දේසික යන සම්මත පිළිවෙළටයි. උදාහරණයක් වශයෙන් කැප්පෙටිපොළ ශ්‍රී සුභද්‍රාරාම විහාරස්ථානයට යන දූතයාට පවසන්නේ පිළිවෙළින් ත්‍රිවිධ චෛත්‍ය වඳින ලෙසයි.[8]



## ස්ත්‍රී වර්ණනාවල ස්වභාවය

භික්ෂූන් වහන්සේ නමක විසින් රචනා කර භික්ෂූන් වහන්සේ නමක් හරහා තවත් භික්ෂූන් වහන්සේ නමක් වෙත පොදු අරමුණක් සහිතව එවනු ලබන පණිවුඩයකදී ස්ත්‍රී චරිත වර්ණනා කර ඇති ආකාරය ඉතා වැදගත් වේ. ඉතා මනහර ශෘඞ්ගාරාත්මක අදහස්වලින් පොහොසත් ස්ත්‍රී වර්ණනාවන් ඉදිරිපත් කිරීම සංස්කෘත සාහිත්‍ය නිර්මාණවල සුලභ ලක්ෂණයකි. කෙසේ වෙතත් යතිදූතම් කාව්‍යයේදී දවුල්දෙණ නාහිමියන්ගේ ස්ත්‍රී වර්ණනාවල ඇතැම් තැනක ශෘඞ්ගාරාත්මක ස්වරූපයක් දක්නට ලැබේ. එහෙත් එම වර්ණනා කිසියම් සංයමයකින් යුතුව ඉදිරිපත් කර ඇති බවද සඳහන් කළ යුතුය. ඇතැම් විට සංදේශයේ ප්‍රධාන චරිත ත්‍රිත්වයම භික්ෂුව මත පදනම් වන හෙයින් එවැනි සංයමයක් එක් වූවා විය හැකිය. තමන් වහන්සේ සංස්කෘත කවියෙකු වුවත් භික්ෂූන් වහන්සේ නමක් වශයෙන් ස්වකීය ගරුත්වය ආරක්ෂා කර ගනිමින් ශාස්ත්‍රීය කටයුත්තක නිරත වීමට දවුල්දෙණ නාහිමියන් උත්සාහ ගෙන ඇතැයි සිතිය හැකිය. තපෝධනාරාමයේ සිට ජගුවර් රථයෙන් සිකුරු හෝරාවේ ගමන් අරඹන දූතයා හට ආරාමයෙන් පිටත

පළමුවෙන්මදර්ශනය වන්නේ තරුණියන් පිරිසකි. එහෙත් එම අවස්ථාව කෙතරම් සංයමයකින් යුතුව වර්ණනා කර තිබේදැයි වමසනු වටී.

"සිසිල් දියෙන් පිරුණු කළ උකුලුවල තබාගෙන, මඳසිනා යුත් ප්‍රිය මුහුණුවලින් හමු වූවන් පිණවමින්, ඉදිරිමග දුටු දුටු, තරුණියෝ ඔබ කරා පැමිණ සැදැහැයෙන් හා බැතියෙන් හිස නමා නමස්කාර කරති." (23)

දවුල්දෙණ නාහිමියන්ගේ මෙවැනි වර්ණනාවල කිසිදු ශෘඞ්ගාරාත්මක සංකල්පයක් ගැබ් වී නැති අතර ආගමික භාවයන් තවදුරටත් ඉස්මතු කිරීමට එය මග පාදයි. එහෙත් ශ්‍රී පාද පද්මය වන්දනා කර ඉදිරියට ගමන් කරද්දී හමුවන ජල ස්නානයේ නියුතු කාන්තාවන්ගේ දර්ශනය සඳහන් කිරීමේදී කිසියම් ආකාරයක ශෘඞ්ගාරාත්මක වර්ණනාවක් එක් කර ඇත. එම ප්‍රස්තුතයේ ස්වභාවය අනුව එවැනි ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම අනුචිත යැයි රචකයා කල්පනා කරන්නට ඇත. යතිදූතම් කාව්‍යයේ එම කොටස (92 - 94 දක්වා පද්‍ය) කියවන්නෙක් එය අසංයමශීලී වර්ණනාවක් ලෙස කල්පනා නොකිරීමට හේතු දෙකක් ඉදිරිපත් කළ හැකිය. පළමු වැන්න නම්, ස්ත්‍රීන් ජල ස්නානය කරන අවස්ථාවක් වර්ණනා කිරීමේදී එහි තත් වූ ස්වභාවය සඳහන් නොකර සිටීම කාව්‍යයේ ගලායාමටත් රස ජනනයටත් බාධා ඇති කළ හැකි වීමයි. එය එසේ නොකර කාව්‍යයේ ගමන් මග වෙනත් දිශාවකට යොමු කළා නම් එයින් කවියා සිදු කරන්නේ තම වර්ණනා චාතුර්යය පිළිබිඹු කළ හැකි වටිනා



අවස්ථාවක් හිතාමතාම මග හැරීමකි. එසේම කාව්‍යයේ වර්ණනාත්මක පාර්ශ්වයට ආගමික සිතැඟියාවන් හෝ සංකල්ප අනවශ්‍ය එක් කර ගැනීමක් ලෙසද කෙනෙකුට කල්පනා කළ හැකිය. අනෙක් අතට මෙවැනි සාහිත්‍ය නිර්මාණ රස විඳීමෙන් පරිචය ලැබූ පාඨකයෙක් මෙවැනි අවස්ථාවකදී කවියා වෙතින් බලාපොරොත්තු වන්නේ ඊට අනුරූපී වර්ණනාවකි. එවැන්නක් නොතකා හැරීමෙන් පාඨකයා කෘතිය කෙරෙහි මන්දෝත්සාහි විය හැකි අතර කවියාගේ කවි කුශලතාව පිළිබඳවද කිසියම් අයහපත් තක්සේරුවකට පැමිණීමද නොවැළැක්විය හැකිය. එය ඉහත කරුණට අදාළ දෙවැනි හේතුවයි.

"මත් ඇත් කුඹු තරම් මහත් නිතඹ, රනකුඹු වැනි පුන් පියොවුරු, මිටින් ගත හැකි සිහින් කොමළ ඉඟ, බිඹුපල වන් දෙතොල්ද කරණකොටගෙන අනඞ්ගයාගේ භාරයාවන් වැනි වූ, (92)

මඳ සිනා රැසින් ඇලුම් කටයුතු මුහුණු, බොහෝ සෙයින් එල්බුණු සැරසූ නිල්කෙස්, පිපි නිලුපුල් වැනි දිගු නෙත්, පිපුරු තෙක් දිය රෙද්දෙන් වැසුණු සිරුරු ඇති, (93) වරුවෙන් වැඩ නිම කළ දැඩි අව්වෙන් පීඩිත කාන්තාවෝ එක්රැස්ව පැමිණ, මඟ අසල පීලිවලින් නෑමෙන් තෙත් සිරුරු ඇත්තියෝ දියකිඳුරියන්ගේ සමත්වයට පැමිණෙති." (94)

මෙම ස්ත්‍රී වර්ණනාත්මක පද්‍ය ත්‍රයේ අන්තර්ගත සංකල්ප සංස්කෘත හා සිංහල සාහිත්‍ය නිර්මාණවලදී බහුල ලෙස දැකිය හැකිය. ඒ අනුව දවුල්දෙණ නාහිමියන් මෙහිදී

පූර්ව සාහිත්‍ය නිර්මාණවල ආභාසය නො අඩුව ලබා ඇති බව ප්‍රකටය. වෙනසකට ඇත්තේ වෙනත් කාව්‍යවලදී වර්ණනා කෙරෙන කාන්තාවන් මෙන් මෙහි එන කාන්තාවන් සැප පහසු ජීවිතයකට උරුමකම් නොකියන සාමාන්‍ය සමාජය නිරූපණය රන පිරිසක් වීමයි. ඔවුන් රජමාලිගාවේ සිටින බිසවුන් හෝ කුමාරිකාවන් පිරිසක් නොවන අතර උදෑසන පටන් වෙහෙස වී වැඩ කරන පිරිසකි. රජ බිසවුන්ට මෙන් රාජකීය ජල තටාක නොමැති මේ කතුන්ගේ ස්නාන ස්ථානය පිහිල්ලයි. එහෙත් කවියා සඳහන් කරන්නේ මේ කතුන් දිය කිඳුරියන්ට සමාන වන බවයි. ඔවුන්ගේ අඟ පසඟද රූප ශෝභාවද අනූනය. ඒ අතින් මොවුහු රාජකීය කාන්තාවන් හා සම තැන් ගනිති. මෙය ලාංකේය සමාජයේ ස්වරූපයද කවියා අතින් නිරූපණය වන වැදගත් අවස්ථාවකි. මෙම වර්ණනාව මෙසේ යථාර්ථවාදී ස්වභාවයෙන් වර්ණනා නොකර ඊට අතිශයෝක්තියක් එක් කළේ නම් එය කවියාගේ දුර්වලතාවකි. නිර්මාණය පාඨකයාගෙන් දුරස් වීමටද එවැනි සිදු වීම් බලපායි. එහෙයින් කවියාගේ ස්වාධීන කවි මග වටහා ගැනීමට මෙවැනි වර්ණනා හේතු වේ.

ඉහත සඳහන් කළ පද්‍ය ත්‍රයෙන් අනතුරුව කවියා සිදු කරන ප්‍රකාශයද ඉතා සුවිශේෂී වූවකි. එය කවියාගේ සියුම් උපක්‍රමයක් විය යුතුය.

"පින්වත් බුදුපුත ! "නාන්නා වූ ස්ත්‍රීන් බලා සිත පෙරළියක් ඇති නොකරගන්න. සිහියෙන් යුක්තව පාර බලාගෙන, උවදුරකින් තොරව ඉදිරියට රිය ගමන් කරව"යි රියදුරාට අණ දෙන්න." (95)



ජල ස්නානය කරන ස්ත්‍රීන් දෙස බැලීමෙන් සිත පෙරළියක් ඇති කර නොගෙන රිය ඉදිරියට ගමන් කරවන ලෙස රියැදුරට අණ කරන්නැයි නියම කරන්නේ සන්දේශ හාරක භික්ෂුවටයි. මේ ස්වරූපයේ වෙනත් නිර්මාණවලදී සන්දේශ ප්‍රේෂකයා ඍජුවම සන්දේශ හාරකයාට උවදෙස් දෙයි. එහෙත් මෙහිදී එවැනි අදහසක් ඍජුව හාරකයාට පැවසිය නොහැක්කේ මෙහිදී එම තනතුර භික්ෂුවකට හිමි වී තිබීමයි. භික්ෂුවකට එවැනි දෙයක් සිහිපත් කිරීම ක්‍රම විරෝධී මෙන්ම විධි විරෝධී වූවකි. එහෙත් පුහුදුන් ගති හේතුවෙන් මෙවැනි දේ දැකීමෙන් ඇතැම් විට භික්ෂුවකගේ සිතෙහි වුවත් අසමතුලිතතාවක් ඇති නොවේ යැයි සිතිය නොහැකිය. ඒ බව වටහාගත් කවියා රියැදුරුට උවදෙස් දෙන ව්‍යාජයෙන් සන්දේශ හාරක භික්ෂුවටද සිහි කැඳවීමක් කරයි. මීට පෙර සඳහන් කරන ලද විසිතුන්වැනි පද්‍යයෙන්ද සිදු කරන්නේ මෙවැන්නකි. ගමනාරම්භයේදීම මුණ ගැසෙන දිය රැගෙන යන පිවිතුරු යුවතියන් ලවා නොපමාව සන්දේශ හාරක භික්ෂුවට වන්දනා කරවයි. එයින් වෙනත් ඉසව්වකට සිත ඇදී යෑමට ඇති ඉඩකඩ අහුරා දමයි.

### වෘත්ත භාවිතය

යතිදූතම් කාව්‍යයේදී වෘත්ත වර්ග නවයක් භාවිත කර ඇත. එමගින් වෘත්තවල විවිධතාවක් ඇති වන අතර කාව්‍යයේ මනහරබවද ප්‍රගුණ කෙරේ. කාව්‍යය පුරා භාවිත

කර ඇති වෘත්ත පිළිබඳවත් ඊට අදාළ පද්‍ය පිළිබඳවත් සම්පූර්ණ විස්තරයක් පහත දැක්වේ.

| වෘත්තයේ නම | ශ්ලෝක අංකය | ශ්ලෝක ප්‍රමාණය |
|---|---|---|
| අනුෂ්ටුභ් | 201 | 01 |
| දෝධක | 126 - 129 | 04 |
| ඉන්ද්‍රවංශා | 123, 167 | 02 |
| වංශස්ථ | 118 - 121, 136 - 142, 156 - 166, 168, 172 - 176, 178, 193 - 195, 198, 202, 218 - 221, 224 - 235 | 50 |
| වසන්තතිලකා | 1 - 5, 14, 16 - 19, 54 - 69, 71 - 77, 81, 90 - 96, 99 - 117, 123, 169 - 171, 177, 180, 191, 192, 196, 197, 199, 200, 203, 210 - 217, 222, 223 | 83 |
| මාලිනී | 143 | 01 |
| මන්දාක්‍රාන්තා | 6 - 13, 20 - 49, 52, 53, 70, 80, | 75 |



| | | |
|---|---|---|
| | 88, 89, 97, 98, 144 - 155, 181 - 187, 189, 190, 204 - 209, 236, 238 | |
| ස්‍රග්ධරා | 15, 51, 78, 79, 82 - 87, 124, 132 - 135, 179, 188, 237 | 18 |
| ශාර්දූලවික්‍රීඩිත | 131 | 01 |

## වර්ණනා

යතිදූතම් යනු දූත කාව්‍යයක් වන හෙයින් එහි වර්ණනා විෂයයද විවිධතාවක් ගනී. එහි ආරම්භයේ පටන් අවසානය දක්වාම කිසියම් නිශ්චිත ගමන්මගක් පුරා දූතයා මෙහෙයවන හෙයින් ඊට අනුරූප වන පරිදි වර්ණනාවන්ද භාවිත කළ යුතුය. සිංහල සන්දේශවලද මෙම ස්වභාවය මැනවින් දැකගත හැකිය. යතිදූතම් කාව්‍ය සංග්‍රහයේ අන්තර්ගත සියලු වර්ණනා පිළිබඳ සැලකීමේදී පහත දැක්වෙන ආකාරයේ වර්ගීකරණයක් සිදුකළ හැකිය.

| වර්ණනා වර්ගීකරණය | | |
|---|---|---|
| පුද්ගල වර්ණනා | ගිහි | රාවණ රාජ වර්ණනාව (54 - 67), තේ දලු නෙළන ලඳුන් (92 - 94), නෙරන්ජන් විජයරත්න දියවඩන නිළමෙතුමා (131), සිරිමා බණ්ඩාරනායක අගමැතිතුමිය (165 - 170), යක්කල, වික්‍රමාරච්චි |
| | | වෛද්‍යාචාර්යතුමා (177 - 179), ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා (193, 194), ආර්. ප්‍රේමදාස අගමැතිතුමා (195 - 196), ආනන්ද තිස්ස ද අල්විස් ඇමතිතුමා (197), ඊ. ඇල්. බී. හුරුල්ල මැතිතුමා (198 - 199), නිශ්ශංක විජයරත්න ඇමතිතුමා (200 - 201), වි.ජ.මු. ලොකුබණ්ඩාර ඇමතිතුමා (202 - 203), ගාමිණී ජයසූරිය ඇමතිතුමා (212) |
| | පැවිදි | ජිනරතන මහනාහිමියෝ (15), දවුල්දෙණ මේධානන්ද හිමි (16, 17), කරගහල්පත |



| | | |
|---|---|---|
| | | සුගතනන්ද හිමි (18), ශ්‍රී ගුණානන්ද නාහිමි (31), සුමනසාර මහනාහිමි (35), දවුල්දෙණ ධර්මසිද්ධි නාහිමි (50), උඩුහාවර ජිනානන්ද හිමි (77), විදුරපොල පියතිස්ස මහනාහිමි (78 - 80), කොටකේදෙණියේ ඥානානන්ද නාහිමි (117), සිරිමල්වත්තේ ආනන්ද මහනාහිමි (132), පලිපාන චන්දානන්ද මහනාහිමි (133), හාල්යාලේ සුමනතිස්ස අනුනාහිමි (134), යක්කඩුවේ ප්‍රඥාරාම නාහිමි (188), හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි (204 - 210), අකුරටියේ අමරවංශ නාහිමි (222 - 227) |
| ස්ථාන | නගර | වැලිමඩ (27, 28), නුවරඑළිය (68 - 70, 73 - 76), පුස්සැල්ලාව (97), ගම්පොළ (101 - 109, 118), පේරාදෙණිය (119), මහනුවර |

| | | |
|---|---|---|
| | | (123), කඩුගන්නාව (143), මාවනැල්ල (146), කෑගල්ල (150, 151), නිට්ටඹුව (156), කැලණිය (181), කොළඹ (190), |
| | ගම් | සපුගොල්ල (07), දිවුරුම්වල (30), විදුරපොල (36), සීතාඑළිය (51), රම්බඩ (96), කජුගම (152 - 154) |
| | ආගමික ස්ථාන | සපුගොල්ල තපෝධනාරාමය (8), කැප්පෙටිපොල සුභද්‍රාරාමය (33), සීතාකෝවිල (52), සමනළ කන්ද (82 - 87), පුස්සැල්ලාව විහාරය (98), මහනුවර දළදා මැඳුර (124 - 130), කැලණිය රාජමහා විහාරය (182 - 187) |
| | ස්මාරක | කැප්පෙටිපොල වීරයාගේ ප්‍රතිමාව (32), බණ්ඩාරනායක ස්මාරකය (171), හික්කඩුවේ |



| | | |
|---|---|---|
| | | ශ්‍රී සුමංගල ප්‍රතිමාව (220), හික්කඩුවේ සුමංගල නාහිමි වැඩසිටි දෙමහල් මැඳුර (221) |
| | වෙනත් | උමා ඔය අතු ගංගාව (24), හක්ගල මල්වත්ත (40), හක්ගල කන්ද (41 - 49), පිදුරුගලාගල කන්ද (71 - 72), මහවැලි ගඟ (99 - 100), පේරාදෙණිය උද්භිද උද්‍යානය (120), හොරගොල්ල වලව්ව (158 - 163), බණ්ඩාරනායක සමාධියේ සිට යක්කල වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය දක්වා මාර්ගය (172 - 176), කැලණි පාලම (189), කොළඹ ජනාධිපති මන්දිරිය (191 - 192) |
| සිද්ධි වර්ණනා | | කිරි දෝනා කතුන් (25), දිය කෙළින කතුන් (110 - 114), උවසු උවැසියන් (137), පාසල් |

| | |
|---|---|
| | යන සිසු සිසුවියන් (138), |
| අධ්‍යාපන ආයතන | ගම්පොළ බුවනෙකබා පිරිවෙණ (116), පේරාදෙණිය විශ්වවිද්‍යාලය (121 - 122), යක්කල වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය (180), විද්‍යොදය පිරිවෙණ (213 - 219) |

## සමාලෝචනය

සංස්කෘත මාධ්‍යයෙන් නූතනයේ විවිධ රචනා සම්පාදනය කරන ශ්‍රී ලාංකේය උගතෙකු වන දවුල්දෙණ ඤාණිස්සර හිමියන් විසින් රචිත යතිදූතම් කාව්‍යය මෙරට සංස්කෘත රචනාවලට නවතාවක් එක් කළ රචනාවක් වශයෙන් හැඳින්විය හැකිය. භාරත දේශයට මේඝදූතය යම් සේ අගනේද එසේම ලාංකේය සාහිත්‍යයට යතිදූතම් කාව්‍ය සංග්‍රහය වටී. මේඝදූතයේදී භාරතීය සංස්කෘතිය යම්සේ ඉදිරිපත් කෙරේද එපරිද්දෙන්ම යතිදූතම් කාව්‍ය සංග්‍රහයේදී ලාංකේය සංස්කෘතිය මැනවින් නිරූපණය කෙරේ. ඊට අමතරව සංස්කෘත අධ්‍යයනය විෂයෙහි මෙරට අද පවා පවතින උනන්දුවත් මෙමගින් ප්‍රකට කෙරේ.



## ආන්තික සටහන්

1. මාරාඞ්ගනාවිජයම් (1983), යතිදූතම් (1987), ධර්මචින්තා (1998), වෛරාග්‍යචින්තා (1995), ආශිඃපුෂ්පමඤ්ජරී (1995), ශ්වානස්තවකාව්‍යම් (1995), යශොධරාචරිතම් (1996), මහාමහෙන්ද්‍රක්ෂීණාශ්‍රවාගමනම් (1997), බුද්ධභක්තිමඤ්ජරී (1997)
2. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කියවන්න, දවුල්දෙණ ඥානේශ්වර ස්වාමීන්ද්‍රප්‍රණීත සංස්කෘත ප්‍රශස්ති කාව්‍ය සංග්‍රහය, සම්පාදක ඃ මීපිටියේ සීලරතන හිමි, ප්‍රකාශක ඃ කරගහැල්පත පඤ්ඤාරතන හිමි, 2014.
3. යතිදූතම්, හැඳින්වීම
4. මේඝදූතය, පරි. පැට්‍රික් නාරාවිල, ගොඩගේ සහ සහෝදරයෝ, 11 පද්‍යය.
5. යතිදූතම්, දවුල්දෙණ ඤාණිස්සර හිමි, මොඩන් පොත් සමාගම, නුගේගොඩ, 2004, 4 පද්‍යය.
6. මෙම සටහනේ වරහන් තුළ යොදා ඇත්තේ පද්‍ය අංකයයි.
7. 'රවුළා මැරී රම්රජ' සිදත් සඟරාව
8. යතිදූතම්, එම, 34 පද්‍යය.